සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

**<u>අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවීම</u>**

අංක 2088/26 හා 2018.11.09 දිනැති උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.11.3.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකරණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) අධි ශ්‍රේණියේ පහත සඳහන් පුරප්පාඩු සඳහා උසස් කිරීමට ඉල්ලුම්පත්‍ර කැඳවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

2023.08.23 දිනට අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | අධි ශ්‍රේණියේ නිලධර සංඛ්‍යාව | | **2023.08.23** දිනට සේවයේ නියුතු සංඛ්‍යාව | **2023.08.23** දිනට පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | අධිකරණ ලිපිකරු අධි ශ්‍රේණිය | 116 | | 99 | **17** |
| 02 | අධිකරණ භාෂණ පරිවර්තක අධි ශ්‍රේණිය | 15 | | 12 | **03** |
| 03 | අධිකරණ ලඝු ලේඛක අධි ශ්‍රේණිය | 58 | | 44 | **14** |
| 04 | අධිකරණ යතුරු ලේඛක අධි ශ්‍රේණිය | 29 | | 12 | **17** |
| | | 218 | | 167 | **51** |

02. සේවා ව්‍යවස්ථාවේ10.11.3.1 හි සඳහන් සුදුසුකම්

i. I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

ii. උසස්වීම් දිනයට (2023.08.23) පූර්වාසන්නයේ වූ වසර 05 තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර එම කාලයට අදාලව වැටුප් වර්ධක පහ (05) උපයාගෙන තිබීම

iii. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

සැලකිය යුතුයි : උසස්වීම් ලබාදීම සලකා බලන දින වන විට නොනිමි විනය කටයුතු පවතින නිලධාරීන් උසස් කිරීම් සඳහා සලකා බලනු නොලැබේ.

03. **2023.08.23** වන දිනට ඉහත 02 ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කල නිලධාරීන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ සමග එකී ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇමුණුම 07' හි සඳහන් ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත්‍ර **2023.11.17** දිනට පෙර '**<u>අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12'</u>** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ '**<u>අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම</u>** ' යන්න සඳහන් කල යුතුය.

04. අයදුම්පත්‍ර එවනු ලබන නිලධාරීන් විසින් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර ගැනීමෙන් පසු, පවතින පුරප්පාඩු සංඛ්‍යාව සලකා බලා ජ්‍යෙෂ්ඨත්වය සහ/හෝ කුසලතාවයද සලකා බලා උසස් කිරීම් සිදු කරනු ලබන අතර එසේ උසස්වීම් ලබන නිලධාරීන් ව්‍යවස්ථා සංග්‍රහයේ "ඕ" පරිශිෂ්ඨයෙහි අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ තනතුරු නාමාවලිය යටතේ සඳහන් අධිකරණයක පමණක් සේවය කිරීමට යටත් වේ.

05. කුමන හේතුවක් නිසාවත් මෙම කාර්යාලයට එවනු ලබන අනෙකුත් ලේඛන සමඟ අයදුම්පත් නොඑවිය යුතු අතර අයදුම්පත් සමඟ ඊට අදාල සනාථ කරන ලද සහතික පමණක් එවිය යුතුය. මෙම උපදෙස් නොසලකා එවනු ලබන අයදුම්පත් හා ලිපි ලේඛන සම්බන්ධයෙන් වගකියනු නොලැබේ. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත් හා නිසි අයුරින් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මෙම ලිපිය ඔබ අධිකරණයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ (අධිකණ ලිපිකරු, අධිකරණ භාෂණ පරිවර්තක, අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක) I ශ්‍රේණියේ නිලධාරීන්ට දැන ගැනීමට සලස්වන්න.

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 ඔක්තෝබර් මස 17 වන දින.
කොළඹ 12,
අධිකරණ වො කොමිෂන් හා ලේකම් කාර්යාලයේදීය.